# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/91 – 2018 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා – 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

යටිනුවර ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටිනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යංශය.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
පල්ලෙකැලේ දී ය.

*යෝජනාව*

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක (2) 1 වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු අයකිරීම සඳහා ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් 10% විනෝද බද්දක් අයකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

09 - 612/1

1A – PG 4207 – 32 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් දෙවන උපවගන්තියෙන් පැවරි ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
පල්ලෙකැලේ දී ය.

*යෝජනාව*

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ අංක(2) 1 වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු අයකිරීම සඳහා විනෝද කටයුත්තකට ඇතුළුවන විට එය සිනමා සංදර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් 7.5% ක ප්‍රමාණයකට සමාන ප්‍රමාණයක්ද වෙනත් සියලු විනෝද කාර්යයන් වන විට ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් 20% මුදලක්ද අයකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

09 - 612/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.